## බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය 2022-2023
## තරග විස්තර පත්‍රිකාව

බස්නාහිර පළාත් යොවුන් ලේඛකයන් දිරි ගැන්වීමේ අරමුණ ඇතිව සාහිත්‍ය තරගාවලියක් පැවැත්වීමට බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සැලසුම් කර ඇත. මේ සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි වයස අවුරුදු 16-35 අතර තරගකරුවන්ට සහභාගි විය හැකිය. සිංහල මාධ්‍යයෙන් පමණක් තරග නිර්මාණ භාර ගනු ලැබේ.

- **විශේෂ සටහන 01 - : 2022 වසර බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය සඳහා නිර්මාණ භාර ගැනීම සිදු කළ ද තරගය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවනු ලැබූ අතර, ඒ අනුව 2022 වර්ෂයේ යොමු කරන ලද නිර්මාණ ද 2023 වර්ෂයේ බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය සඳහා අදාල කර ගනු ලැබේ. ඒ අනුව 2022 වර්ෂයේ යම් තරග අංශයක් සඳහා නිර්මාණ යොමු කරන ලද නිර්මාණකරුවන් එම තරග අංශය සඳහාම 2023 වර්ෂයේ දී නැවත නිර්මාණ යොමු කරන්නේනම් එම නිර්මාණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

තරග අංකය හා තරග නාමය

- තරග අංකය - 1
  යොවුන් නවකතා තරගය
  (වචන 20,000 - 25,000 අතර)

- තරග අංකය - 2
  යොවුන් කෙටිකතා තරගය
  (වචන 1000-1500 අතර)

- තරග අංකය - 3
  යොවුන් පද්‍ය (නිසඳැස්) තරගය
  (පේළි 40-60අතර)

- තරග අංකය - 4
  යොවුන් පද්‍ය(සඳැස්) තරගය
  (පේළි 40-60අතර)

- තරග අංකය - 5
  යොවුන් ගී පද රචනා තරගය
  (ගායනයට සුදුසු වචන සංඛ්‍යාවක්)

විස්තර හා කොන්දේසි

1. එක් තරගකරුවකුට එක් තරග අංශයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි. එහෙත් තරග එකකට වඩා වැඩි ගණනකට නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.( විශේෂ සටහන 01 බලන්න)

2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 16 - 35 අතර විය යුතුය. වයස තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ හැඳුනුම්පතෙහි පිටපතක් තමා විසින්ම සහතික කර නිර්මාණය සමඟ යොමු කිරීම අනිවාර්ය වේ.

3. සියලු නිර්මාණ ස්වතන්ත්‍ර විය යුතු අතර මොනම ආකාරයකින් හෝ වෙනත් නිර්මාණයකින් උපුටා ගත් හෝ අනුවර්තනය කර ගත් හෝ ඇසුරු කර ගත් නිර්මාණයක් නොවිය යුතුය. එසේම මෙයට පෙර කිසිදු

ආකාරයකින් හෝ ප්‍රකාශයට පත් වී නොමැති නිර්මාණයක් විය යුතුය. ඒ සඳහා තරගකරු විසින්ම තම නිර්මාණය ස්ව නිර්මාණයක් බව අයදුම්පත්‍රයේ තහවුරු කළ යුතුය.

4. අයදුම්පතෙහි පදිංචිය පිළිබඳ තොරතුරු ග්‍රාම නිලධාරී මඟින් සහතික කර එවිය යුතු අතර නොඑසේනම් පදිංචිය පිළිබඳ මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකයක් අයදුම්පත සමඟ එවිය යුතුය.

5. සෑම නිර්මාණයක්ම A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියා හෝ පරිගණක මගින් සකසා හෝ තිබිය යුතුය.

6. සෑම නිර්මාණයක් සමඟම අයදුම්පතක් අමුණා එවිය යුතුය. තරගකරුගේ අනන්‍යතාව දැක්වෙන කිසිදු සලකුණක් නිර්මාණ අත්පිටපත්වල නොතිබිය යුතුය. (ආදර්ශ අයදුම්පත පහත දැක්වේ.)

7. අයදුම්කරුවෙකු අංශ කිහිපයක් සඳහා නිර්මාණ යොමු කරන්නේනම් එහි පිටපත් වෙන් වෙන්ව එවිය යුතුය.

8. නිර්මාණ එවීමේ දී මුල් පිටපත එවීම අවශ්‍ය නොවන අතර, නිර්මාණය පිටපත් තුනකින් එවිය යුතුය. තෝරා නොගන්නා පිටපත් ආපසු එවීමට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය කටයුතු කරනු නොලැබේ.

9. සෑම තරගයකින්ම ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සහ ප්‍රශස්ත ඇගයීම් සඳහා ස්ථාන හත බැගින් තෝරා සම්මාන හා මුදල් ත්‍යාග පිරිනැමීමට කටයුතු කර ඇත.

10. නිර්මාණ භාර ගන්නා අවසාන දිනය <u>2023 මාර්තු 31</u> දින වේ. එදිනට හෝ එයට පෙර ලැබෙන ලෙස පහත සඳහන් ලිපිනයට නිර්මාණ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ගෙනවිත් බාර දීම සිදු කළ යුතුය.

11. **<u>නිර්මාණ භාරදීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය 2022-2023 යනුවෙන් සඳහන් කොට ඉදිරිපත් වන තරගයේ නමද සඳහන් කළ යුතුයි.</u>**

ලේකම්,  
අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,  
බස්නාහිර පළාත,  
නො.204,  
02 වන මහළ,  
නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,  
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,  
බත්තරමුල්ල

12. බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

13. බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීම සඳහා නිශාන්ත ලියනගේ මයා, සංස්කෘතික නිලධාරී 078-2420493 දුරකතන අංකය ඔස්සේ සම්බන්ධ කර ගත හැකිය.

..............................................  
සිරිසෝම ලොකුවිතාන  
ලේකම්  
අධ්‍යාපන , සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය  
බස්නාහිර පළාත.